# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## MINISTRY OF INVESTMENT PROMOTION

# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) ජාතික කාබනික පාලන ඒකකය (NOCU) සඳහා වෙබ් ද්වාරය සැළසුම් කොට සංවර්ධනය කිරීම හා වසර 5 ක කාලයකට එය නඩත්තු කිරීම.

**කොන්ත්‍රාත්තුව : EDB/2023/NOCU/001**

1. අපනයන සංවර්ධන මණ්ඩලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත විස්තර කොට ඇති කොන්ත්‍රාත්තුව සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවයි.
2. කාර්යයේ විශයපථය
   - NOCU සඳහා වෙබ් ද්වාරය සැලැසුම් කොට සංවර්ධනය කිරීම
   - එම කාර්යය වසර 5 ක් සඳහා නඩත්තු කිරීම.
3. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
4. සුදුසුකම්ලත් ලංසුකරුවන්ට ඉහත ප්‍රසම්පාදනය සඳහා නෛතික සුදුසුකම් තිබිය යුතුය. ලංසුකරු 1990 අංක 4 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තියෙන් ඒකාබද්ධ කරන ලද (149 වැනි අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කළ සමාගමක් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ 1982 අංක 17 හා 2007 අංක 07 දරන අධ්‍යක්ෂවරුන්ගේ පනතේ විස්තර තොරතුරු පිළිබඳ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
5. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක අයදුම්කරු පහත සඳහන් සුදුසුකම් සපුරා ලිය යුතුය.
   - කිසිදු රාජ්‍ය ආයතනයකින් අසාධු ලේඛනගත නොවූවකු විය යුතුය.
6. ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලය www.srilankabusiness.com යන EDB වෙබ අඩවියේ "announcement" යටතේ බාගත කරගත හැකිය.
7. වෙබ් අඩවියෙන් ලංසුකරණ ලිපිලේඛන ලබාගන්නා සමාගම් ආපසු නොගෙවන රු. 2,500.00 ක ගාස්තුවක් ලංකා බැංකුවේ ලේක්වීව් ශාඛාවේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අංක 306605 දරන ගිණුමෙහි තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා බැංකු තැන්පතු ලදුපතෙහි පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය. (එම තැන්පතු ලදුපතෙහි පිටපතක් නොමැති ලංසු ලියවිළි වලංගු ලංසු ලෙස භාර නොගැනේ.)
8. නිසි පරිදි සම්පූර්ණ කරන ලද තාක්ෂණික අභිලාෂ පිටපත් දෙකකින් යුක්තව මුල් පිටපත හා අනු පිටපත ලෙස සලකුනු කර මුද්‍රා තබන ලද කවරයක බහා, වෙනම මුද්‍රා තබන ලද කවරයක මූල්‍ය අභිලාෂය බහා එම කවර දෙකම තනි මුද්‍රා තබන ලද කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ යොමු අංකය හා ලංසු නාමය සඳහන් කර 2023-06-05 දින පස්වරු 2.30 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත ලිපිනයේ 6 වෙනි මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ලංසු බහාලන පෙට්ටියට බහාලීම හෝ'කළ හැකිය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙක් ඉදිරියේ තක්ෂණික යෝජනා විවෘත කරනු ලැබේ.
9. ලංසු දින 66 ක් දක්වා වලංගු විය යුතුය.
10. පූර්ව ලංසු රැස්වීම, ලංසු ලිපිලේඛනවල සඳහන් පරිදි 2023-05-24 දින පෙ.ව. 10.00 ට 'Zoom' තාක්ෂණය ඔස්සේ "ඔන්ලයින්" ක්‍රමයට පැවැත්වේ.
11. අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
12. වැඩිමනත් පැහැදිලි කරගැනීම් සඳහා EDB, ජාතික කාබනික පාලන ඒකකයේ, සහකාර අධ්‍යක්ෂිකා හා මධුමාලි මෙනවිය දුරකථන අංක 077-1186031 හෝ 0112300705 (දිගුව - 235) ඔස්සේ සම්බන්ධ කරගත හැක.

**සභාපතිනිය,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB ටවර්, නො. 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන : 011-2300705 ෆැක්ස් : 011-2300728**
**වෙබ් අඩවිය: www.srilankabusiness.com**